www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# මරන සංඛ්‍යාව ඉහල නගිද්දී චීනයේ භූමි කම්පාව ගැඹුරු සමාජ විභේදනය හෙලිදරව් කරයි

## As death toll climbs, Chinese earthquake exposes deep social divide

**ජෝන් චැන් විසිනි**
**2008 මැයි 15**

මැයි 12 වන දින චීනයේ සිචුවාන් ප්‍රාන්තයට බලපෑ පලමු පෙලේ භූ කම්පනය දැවැන්ත මානව ඛේදවාචකයක් විය. දැනට 15,000ක් වන නිල මරන සංඛ්‍යාව තවත් ඉහල යනු ඇතැයි බලාපොරොත්තු වේ. අවම වශයෙන් පුද්ගලයන් 26,000ක් සුන්බුන් අතර වැලලී ඇතැයි ද ඉන් බොහෝ දෙනෙක් මියගොස් ඇතැයි ද විශ්වාස කෙරේ. ඊයේ පැවති අගමැති වෙන් ජියාබාවෝ ගේ කාර්ය සාධන රැස්වීමේ ගනන්හිලව්වලට අනුව කම්පනය බලපෑ ප්‍රදේශය වර්ග කිලෝ මීටර් 65,000 කි. ඊට විශාල නගර 6ක් හා දිස්ත්‍රික්ක 44ක් අයත්වේ. ප්‍රදේශයේ නිවැසියන් මිලියන 20 කින් අඩක් භූ කම්පනයෙන් සෘජුව ම විපතට පත් වූහ.

චීන හමුදාව හා පොලිසිය කම්පනයේ පිටස්තර කේන්ද්‍රයේ පිහිටි වෙන්චුවාන් නගරය ද ඇතුලු අතිශයින්ම දුෂ්කර ප්‍රදේශවලට ලඟාවෙමින් සිටිය ද නරක කාලගුනය සහ හානියට පත් මහා මාර්ග නිසා බුල්ඩෝසර් හා අනෙකුත් බර යන්ත්‍රෝපකරන ප්‍රවාහනයට බාධා එල්ල වී තිබේ. දැඩි ලෙස හානියට පත් දිස්ත්‍රික්කවලට ගුවනින් ආහාර හෙලීම සඳහා තවත් හෙලිකොප්ටර් 90ක් යෙදවීමට වෙන් නියෝග කලේය. මේතාක් දුරට හෙලිකොප්ටර් 20 කින් සපයන ලද සහන නොසෑහෙයි. මෙහෙයවා ඇති සෙබලු සංඛ්‍යාව ලක්ෂය දක්වා වැඩිකර තිබේ. කෙසේ වෙතත් සෙබලුන් හා සහන කන්ඩායම්වලට සිරවී සිටින්නවුන් බේරාගැනීමට සිදුව ඇත්තේ සිය දෑත් හා නොදියුනු උපකරනවලින් බැවින් ඒ සඳහා කල් ඉකුත් වෙමින් තිබේ.

සිතියමින් මුලුමනින්ම පාහේ අතුගෑවී ගොස් තිබෙන සමතලාවූ වින්සිවු නගරය රූපවාහිනී තිරවල දර්ශනය කෙරුනි. 10,000 ක්වූ එහි ජනගහනයෙන් සහන සේවකයන්ට සොයා ගැනීමට හැකිව ඇත්තේ ජීවතුන් අතර සිටි 2300ක් දෙනා පමනි. ඉන් අඩක්ම බරපතල ලෙස තුවාල ලබා සිටියහ. සහන කටයුතු හමුවේ ඇති දුෂ්කරතාවන්ට අමතරව නිවාස අහිමිවූ ලක්ෂ ගනනක් ජනතාව හදිසි සැපයුම් හා රැකවරන නොමැති කමින් පීඩාවට පත්ව සිටිති. පෙර දින සවස්වන විට, සැලකිය යුතු පසු කම්පනයන් පිලිබඳ අනතුරු ඇඟවීම් හමුවේ මයන්යෑංග් නාගරික පාලනය 700,000ක් ප්‍රදේශ වාසීන්ට සියලු ම ගොඩනැගිලිවලින් ඉවත්වන ලෙස නියෝග කලේය.

*ඇසෝසියේටඩ් ප්‍රවත්* සේවය මෙසේ වාර්තා කලාය. "මං මාවත් වල සිටි නිවාස අහිමිවූවන් ආධාර ඉල්ලා හඬ නැගූ අතර තුන්වන රත්‍රියත් ගතකිරීම සඳහා මිනිසුන් කැලි කසලින් ගහන අනාථ කඳවුරු තුල රැස්කමින් සිටියහ. දරුනු ලෙස විනාශයට පත් දිසත්‍රික්කයක නගරයක් වන හැංවෑංග් හි දිවි ගලවාගත් අය වාහනවලින් දෙන දෙයක් ගැනීමට රැස්කමින් සිටියහ. එකිනෙකා සමඟ හැප්පෙමින් ඔවුන් එක් වාහනයක් වෙත දිව ආවේ මගියෙකු ඉන් පිටතට දුන් වතුර බෝතල් ගැනීමටය."

සත් මහල් ගොඩනැගිල්ලක් වන හැන්ග්වෑංග් ආරෝග්‍යශාලාව බිඳවැටී ඇත. දිවි ගලවාගත් සෞඛ්‍ය සේවකයන් මූලික සේවා සැපයීම සඳහා ටයර් කම්හලක මාර්ගයේ කූඩාරම් ඉදිකලහ. 25 හැවිරිදි හෙද සේවිකාවක් වන ෂාවෝ ෂියෝලි *ඇසෝසියේටඩ් ප්‍රවත්* වෙත මෙසේ පැවසීය. "මම හිරිවැටී සිටින්නෙමි. පලමු දිනයේදී පාසැල කඩාවැටීමෙන් ලමුන් සිය ගනනක් මියගියා. බරපතල තුවාල ලබා සිටි ඉතිරි අය වෙනුවෙන් අපට කලහැකි වූයේ ඉතා පොඩි දෙයක් පමනි."

චීනය පුරා හා ජාත්‍යන්තරව ද පිරී ඉතිරී ගිය අනුකම්පාවක් දැල්වුනු අතර භූ කම්පනයෙන් විපතට පත් වූවන්ට ආධාර පිරිනමනු ලැබිනි. විපතට පත්වූවන්ට ආධාර වශයෙන් මුදල් හෝ ලේ දීමට බොහෝ චීන නගරවල කම්කරුවෝ පෙල ගැසී සිටියහ.

භූ චලනය ස්වාභාවික විපතක් වුව ද විනාශයේ හා මරනයේ පරිමානය හෙලිදරව් කලේ ජනතාවගේ දිවි පැවැත්මට හා සුරක්ෂිත භාවයට වඩා පුද්ගලික ලාභය ඉහලින් තබාගත් අතාත්වික සමාජ පර්යායක් පිලිබඳ යථාර්තයේ යෝධ විරූපයකි. දුගී නගර හා ගම්මානයන්හි ගොඩනැගිලිවල පහත් තත්වයත් පොහොසතුන් හා දුප්පතුන් අතර නග්න අසමානත්වයත් කෙරෙහි කෝපය වැඩෙමින් තිබේ.

අඩුම තරමින් සිචුවාන් හි පාසැල් 9 ක් හා ආරෝග්‍යශාලා දෙකක් බිමට සමතලා විය. පාසැල්

ලමුන්ගේ මරන පිලිබඳව කෝපය යොමුව ඇත්තේ පිටතින් මනා පෙනුමක් සහිත වුවත් ඇතුලතින් දොදොල් වැනි සෝයා බෝංචි කෑම ජාතියක් වන " ටෝෆු" වැනි බාල ඉදිකිරීම් සහිත ගොඩනැගිලි කෙරෙහිය. සීමිත ආරක්ෂක විධි විධාන පවා ආන්ඩුවේ නිලධාරීන් හා ඉදිකරන්නන් අතර දූෂිත ගනුදෙනුවලින් යටපත් කෙරේ. පෙර දින *ලොස් ඇන්ජලීස් ටයිම්ස්* මාර්ග ගත ප්‍රකාශයක් සඳහන් කරමින් මෙසේ විමසීය. "සියලු ම ආන්ඩුවේ ගොඩනැගිලි සතුටුදායක නම් මෙතරම් පාසැල් සංඛ්‍යාවක් බිඳවැටුනේ මන්ද? මෙය සාහසිකය."

බිඳවැටුනු ගොඩනැගිලිවලට සිසුන් 900 ක් වැලලී ගිය ඩුජියාන්ගියාං නගරයේ ජුයුආං ද්වීතීයික පාසැලේ තුවාලකරුවන්ට වෛද්‍ය ටියැං ප්‍රතිකාර කර තිබේ. අද දින ඕස්ට්‍රේලියානු පුවත්පතකට ඔහු මෙසේ ප්‍රකාශ කලේය. "මෙය වෙන කිසිවක් නොව දූෂනයයි. ඔවුන් බාල වර්ගයේ සිමෙන්ති හා වානේ යොදාගෙන තිබේ. මෘත ශරීරාගාරය ලමුන්ගේ මලසිරුරුවලින් පිරී තිබේ. එය මහ පොලවේ නරකාදියයි."

දිවි ගලවාගැනීමට වාසනාව තිබූ එක් ගුරුවරයෙක් මෙසේ පල කලේය. "අඩුම ගනනේ 2000 වසරේ පටන්වත් මෙය වඩා සුරක්ෂිත ලෙස යලි ඉදිකරන ලෙස පාසැලෙන් ප්‍රාදේශීය ආන්ඩුව වෙත ඉල්ලීම් ඉදිරිපත් කර තිබේ. එහෙත් කිසිදු පියවරක් ගත්තේ නැත." තවත් ගුරුවරයෙක් මෙසේ පැවසීය. " ප්‍රධාන ගොඩනැගිලි දෙක ඉදිකර ඇත්තේ බිත්ති තැනීම සඳහා පෙර සැකසූ සිමෙන්ති තහඩු වානේ කම්බි අතරින් රුවාලීමෙනි. වැඩ බිමේදී වක්කරන සිමෙන්තිවලින් ඉදිකරන කොන්ක්‍රීට් බිත්ති හා සසඳන විට ඒවා බෙහෙවින්ම කඩා වැටෙන සුලුය."

මෙයට සපුරා ම වෙනස්ව සිචුවාන් හි ක්‍රියාත්මක වන ප්‍රධාන චීන අන්තර්ජාතික සංගතයන්ගෙන් කැනීම් කටයුතු හා විදුලි බල සැපයුම්වල නිරත ඒවා හැරෙන්නට අනෙක්වාට හානි සිදුවී නැත. චෙන්ඩූ හි ටොයොටා වාහන කම්හල ද යමහා ඉලෙක්ට්‍රොනික් උපාංග කම්හල වැනි ජපන් කම්හල් ආරක්ෂක හේතුන් මත වසා තිබුනු අතර සිදුව තිබුනේ සුලු හානියකි. ඉන්ටෙල් එකලස් කිරීමේ කම්හල වැනි එක්සත් ජනපද කර්මාන්ත සම්බන්ධයෙන් ද තත්වය එයයි. වැල් මාර්ට් ගබඩා තුනක් වසා දැමීය. මයික්‍රොසොෆ්ට් හා මෝටරෝලා වෙතින් වාර්තා වූයේ ද සුලු හානි ය. චීනයේ විශාලතම සහල් කේක් නිෂ්පාදකයා වන වාන්ට් වන්ට් චයිනා හෝල්ඩිංග්ස් කම්හල් හතක් වසාදැමූ නමුත් කිසිවකට හානි සිදු නොවීය.

වෙරලබඩ කලාපයන් හා සසඳන විට ආයෝජනයන් අතින් තවමත් සාපේක්ෂව කුඩා නමුත් චීනයේ අභ්‍යන්තර ප්‍රදේශ තුලට විදේශ ප්‍රාග්ධනය වඩ වඩාත් විනිවිද ගොස් ඇති ආකාරය සිචුවාන් හි මෙම සුප්‍රකට සමාගම්වල කටයුතුවලින් පෙන්නුම් කෙරේ. විශාල ආයෝජකයන්ගේ දේපලවල ආරක්ෂාව සඳහා ඉදිකිරීමේ ප්‍රමිතීන් ක්‍රියාත්මක කර තිබුන ද අනෙකුත් ඉදිකිරීම් අමතක කර දමා ඇත.

එක්සත් ජනපදය පදනම් කරගත් යන්ත්‍රෝපකරන නිෂ්පාදනයේ යෙදී සිටින ප්‍රැට් ඇන්ඩ්විට්නි සමාගමේ හිටපු චීන කලමනාකරුවෙක් වන විලියම් ගෝම්ලි *ලොස් ඇන්ජලීස් ටයිම්ස් පත්‍රයට* පවසා ඇත්තේ එහි බද්ධ ව්‍යාපාරය 1996 වසරේදී චෙන්ඩූ හිදී ඉදිකරන ලද බවත් කුලුනුවල ප්‍රමානය දෙගුන කල යුතු බව හා භූ කම්පන පද්ධතීන්ට ඔරොත්තු දෙන පරිදි අත්තිවාරම් ගැඹුරට කැනිය යුතු බවටත් චීන නිලධාරීන් අවධාරනය කල ආකාරයයි. එහි ප්‍රතිපලයක් ලෙස කම්හල 12 වන දින භූ චලනයට ඔරොත්තු දුන්නේය. තවමත් චෙන්ඩූහි ව්‍යාපාර උපදේශකයෙකු ලෙස සේවය කරන ගෝම්ලි තවදුරටත් කියා ඇත්තේ සිචුවාන්හි ප්‍රමිතියෙන් තොර ගොඩනැගිලි රාශියක් ඇති බවය. "මෙවන් බේදවාචකයක් සිදුවන තෙක් ඔබට ඒවා කොපමන තිබේදැයි දැනගත නොහැකිය."

පෙර දිනයේ *වෝල් ස්ට්‍රීට් ජර්නලය* චෙන්ඩූහි භූ කම්පන ප්‍රතිරෝධී තාක්ෂනය යොදාගත් අලුත් උස් ගොඩනැගිලි හා කාර්යාල ඒකක, සමතලාවූ නගර හා ගම්මාන සමග සංසංදනය කලාය. "මෙම බාහිර ප්‍රදේශවල මෑත වර්ධනය තිබියදී ම පොහොසතුන් තව තවත් පොහොසත් වෙද්දී දුප්පතුන් දෙකොන ගැටගසා ගැනීමට යත්න දරන්නාවූ අසමතුලිතය දිගටම පවතියි. සිචුවාන්හි ගම්බද ප්‍රදේශ චීනයේ විශාලතම සංක්‍රමනික කම්කරු මූලාශ්‍රයන්ගෙන් එකක් වුව ද එහි සංවර්ධනය සිදුව ඇත්තේ මඳ වශයෙනි."

සෑම වසරකම මිලියන 15 බැගින් වන නගර කරා ඇදී එන දැවැන්ත ගම්බද ශ්‍රම හමුදාව ලොව විශාලතම ඉදිකිරීම් කලාපය නිර්මානය කර ඇත. 2006 වසරේදී චීනය වර්ග මීටර් බිලියන 1.8 ක ගොඩනැගිලි ඉදිකර ඇති අතර තවත් වර්ග මීටර් බිලියන 4.1 ක් ඉදිකෙරෙමින් තිබේ. අප්‍රකට නගර හා මහා නගර දහස් ගනනක් වැඩෙමින් තිබේ. එහෙත් බෙහෝ ගොඩනැගිලි ඉදිකරනු ලැබ ඇත්තේ කඩිනමින් හා ලාභයට ද, සුරක්ෂිත භාවය ගැන මඳ තැකීමකින් ද යුතුවය. 2006 දී සිචුවාන් චීනයේ ප්‍රාන්ත අතරින් 5 වැනි තැනට ගැනුනු අතර බීජිනය සමග ගත්විට දෙගුනයක් තරම් ගොඩනැගිලි ඉදිකිරීම් නිමවා ඇත.

දුබල සැලසුම්කරනය හා දූෂනය සමග අත්වැල් බැඳගත්, බොහෝවිට උන්මාදයක් වැනි සමපේක්ෂනාත්මක ඉදිකිරීම්වල තවත් ප්‍රතිවිපාකයන් ද ඇත. ලොව විශාලතම ජලදුර්ග ආශ්‍රිත වේලි තුනට හානි සිදුවී නොමැති බව දැන ගැනීමෙන් පසුව චීන

ආන්ඩුව සැනසුම් සුසුම් හෙළීය. කෙසේ වුව ද ජල සම්පත් අමාත්‍යාංශයට අනුව ඊටත් වඩා ව්‍යසනයන් ඇතිකල හැකි ප්‍රධාන කොට ම කුඩා වේලි 391 ක් භූ කම්පනයෙන් හානියට පත්විය.

ඩූජියෑං නගරය ද ඇතුලු ගංගාවේ පහල ජනාවාසවලට තර්ජනයක් වන සිචුවාන්හි දෙවසරක් ගතවී ඇති සිපිංග්පු වේල්ල දෙදරුම්කා ඇති බව පෙනීයාමත් සමග 2000 ක හමුදාවක් එහි පිටත්කරනු ලැබිනි. වසර 2000 දී පැවති ආන්ඩුවේ රැස්වීමකදී භූ-ගර්භ විද්‍යාඥයන් හඳුනාගෙන ඇති කම්පන තීරයට ආසන්න වීමේ හේතුව මත වේල්ල ඉදිකිරීමට විරෝධය පල කලහ. කෙසේ වුව ද අනෙකුත් යටිතල ව්‍යාපෘතීන්වල දී මෙන්ම චීන බලධාරීන් නිමග්නව සිටියේ එවැන්නක් නිෂ්ප්‍රභාකරන, වේගයෙන් ප්‍රසාරනය වන කර්මාන්තය සඳහා කඩිනමින් විදුලි බලය සැපයීමෙහි ය.

චීන ආන්ඩුව පුලුල්ව දැනුනු කම්පනය හා අනුකම්පාවට ආයචනය කරමින් මානුෂික වේශයක් ආරූඪ කර ගැනීමේ උත්සාහයක නිරතව සිටියි. ප්‍රවේශමෙන් කලමනාකරනය කරන මෙම ගලවාගැනීමේ මෙහෙයුමේ හරිමැද සිටින්නේ අගමැති වෙන් ය. දැඩිලෙස හානියට පත් ප්‍රදේශවල සංචාරය කල ඔහු, කොමියුනිස්ට් පක්ෂ නායකත්වය පිටුපස පෙලගැසෙමින් "ඒකාබද්ධ" උත්සාහයක් දැරීමේ අවශ්‍යතාවය ගැන කථා කලේය. ඔහු කැමරා ඉදිරියේ හඬා වැලපුනි. මැයි 13 වන දින වර්ෂාව පැවති අවස්ථාවේ ඔහු ලිස්සා වැටුනි. එහෙත් සෞඛ්‍ය සේවකයන් ගෙන් ප්‍රතිකාර ලබා ගැනීම ඔහු උපේක්ෂාවෙන් ප්‍රතික්ෂේප කලේය. නොතැකීමක් ලෙස පෙනී යා හැකි බැවින් බලධාරින් චීනය තුල ඔලිම්පික් ගිනිසිලුව රැගෙන දිවීම පවා කප්පාදු කලේය.

අන්තර්ජාල යුගය තුල මාධ්‍ය වාරනයේ පැරනි ක්‍රම පල නොදරන බව චීන නායකයන් හොඳින් දැන සිටියි. "හිම වින්නැහිය" පැවති පෙබරවාරි මාසයේදී මිලියන ගනනක් දුම්රිය මගීන් කොටුවී සිටීමත් බොහෝ ප්‍රදේශවල විදුලි බලය බිඳවැටීමත් හේතුකොට ගෙන කෝපය ඇවිල යන තතු තුල එවැනිම ගලවාගැනීමේ මෙහෙයුමක් දියත් විය. තමන් සැලකිලිමත් වන බව පෙන්වීම සඳහා ජ්‍යෙෂ්ඨ දේශපාලන කමිටු සාමාජිකයන් සියලු විපතට පත් ප්‍රදේශ කරා පිටත්කර හරින ලදී. අර්බුදය මධ්‍යයේ *ලොස් ඇන්ජලීස් ටයිම්ස්* පත්‍රය වාර්තා කලේ චීන නායකත්වය අර්බුද කලමනාකරනය පිලිබඳව ඉහල පෙලේ පංති පැවැත්වීම සඳහා එක්සත් ජනපද මහජන සම්බන්ධතා ආයතනයක් කුලියට යොදාගත් බවයි.

මේතාක් දුරට නව ව්‍යාපාරය සාර්ථකව ඇති බවක් පෙනී යයි. *නිව්යෝර්ක් ටයිම්ස්* වාර්තා කලේ " චීන වෙබ් අඩවි හා සංවාද මන්ඩප ආන්ඩුවේ ඉක්මන් ප්‍රතිචාරය පිලිබඳව ප්‍රසංශා මුඛයෙන් කරන කථාබහෙන් පිරී පවතියි. සමහර විට ආන්ඩු විරෝධී ලිපිවලට ද තැනක් ලබාදෙන ටියන්යා වෙබ් අඩවියේ පාඨකයන්, වෙන් මහතා හා සමහර විපතට පත්වූවන් කරා ලගාවීමට මිලිටරිය ප්‍රමාද වීම පිලිබඳව විවේචනය කල අය වසාදැමීමට යුහුසුලු විය. එක් ලිපියක සඳහන් වූයේ කටින් බතල කොල හිටුවීමට සමත් අය මෙම තීරනාත්මක මොහොතේදී වත් කට පියාගන්නවාද? යනුවෙනි."

කෙසේ වෙතත් බීජිං නිලධරය, අකාර්යක්ෂමතාවය, දූෂනය හා නොතැකීම විපතට පත්වූවන්ගේ දුක් වේදනාවන්ට තුඩුදුන්නේය යන කතා මතුව ඒමත් සමග තත්වය වෙනස්වනු ඇතැයි යන්න ගැන සාවධාන වෙයි. ප්‍රචාරක ලොක්කන් රාජ්‍ය මාධ්‍යයට උපදෙස් දී ඇත්තේ වර්ධනයන් "ධනාත්මකව" වාර්තා කරන ලෙසයි. දැවැන්ත හමුදා යෙදවුම හුදෙක් සහන කටයුතු සඳහා පමනක් නොව ඕනෑම විරෝධතාවක් පැනනැගීම වැලැක්වීම සඳහාත් ය.